“ඔබ අතරින් කිසිවකු හෝ තමන් ප්රිය කරන සිහිනයක් දුටුවේ නම්, සැබැවින්ම එය උත්තරීතර අල්ලාහ්ගෙන් වූවකි. එබැවින් ඒ සඳහා ඔහු අල්ලාහ්ට ප්රශංසා කළ යුතුය. ඒ ගැන කතා කළ යුතුය. ඒ හැර තමන් පිළිකුල් කරන යමක් දුටුවේ නම්, සැබැවින්ම එය ෂෙයිතාන්ගෙන් වූවකි. එවිට එහි හානියෙන් ඔහු ආරක්ෂාව පැතිය යුතු අතර එය කිසිවකුට නොපැවසිය යුතුය. මන්ද සැබැවින්ම එය ඔහුට හානිදායක නොවන්නේමය.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කළ ප්රකාශයකට තමන් සවන් දුන් බව
අබූ සඊද් අල් කුඃද්රි (රළියල්ලාහු අන්හු) තුමා විසින් පවසා මෙසේ වාර්තා කරන ලදී: “ඔබ අතරින් කිසිවකු හෝ තමන් ප්රිය කරන සිහිනයක් දුටුවේ නම්, සැබැවින්ම එය උත්තරීතර අල්ලාහ්ගෙන් වූවකි. එබැවින් ඒ සඳහා ඔහු අල්ලාහ්ට ප්රශංසා කළ යුතුය. ඒ ගැන කතා කළ
යුතුය. ඒ හැර තමන් පිළිකුල් කරන යමක් දුටුවේ නම්, සැබැවින්ම එය ෂෙයිතාන්ගෙන් වූවකි. එවිට එහි හානියෙන් ඔහු ආරක්ෂාව පැතිය යුතු අතර එය කිසිවකුට නොපැවසිය යුතුය. මන්ද සැබැවින්ම එය ඔහුට හානිදායක නොවන්නේමය.” [صحيح] [رواه البخاري]

නින්දේදී දකින සතුට දන්වන දැහැමි හීනය අල්ලාහ් වෙතින් වන බවත් ඒ සඳහා අල්ලාහ්ට ප්රශංසා කළ යුතු බවත් ඒ ගැන කතා කළ යුතු බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා මඟ පෙන්වූහ. එමෙන්ම දකින පිළිකුල් සහගත හා දුක දන්වන හීනය, ෂෙයිතාන්ගෙන් වන බවත් එහි හානියෙන් අල්ලාහ්ගෙන් ආරක්ෂාව පැතිය යුතු බවත් එය කිසිවකුට නොපැවසිය යුතු බවත් එතුමාණෝ දන්වා සිටියහ. එසේ කළ විට දුටු හීනයේ පෙළ ගැසී ඇති හානි සහගත දැයින් ආරක්ෂාව ලබන්නට එය හේතුවක් බවට අල්ලාහ් පත්කරනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/3285